# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :-11 ශ්‍රේණිය **විෂය** :- : පෙරදිග සංගීතය **අදාළ සතිය :-** නොවැම්බර් 3 වන සතිය

**2.පාඩම/ ඒකකය**:-.6.2 සොකරි රංග සම්ප්‍රදාය හඳුනා ගනිමින් ගීත ගායනය

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

- සොකරි රංග සම්ප්‍රදාය පිළිබඳව ඇති කියවීමේ පත්‍රිකාව අධ්‍යයනය කරන්න.
- ඒ හා සම්බන්ධ කතා ප්‍රවෘත්තිය ඉදිරිපත් කැන ආකාරය රංග සම්ප්‍රදාය සමග විමර්ශනය කරන්න.
- සොකරි සම්ප්‍රධායේ චරිත හා සිංහල සංස්කෘතිකාංගයක් ලෙස වැදගත්වන ආකාරය විමසන්න.
- සොකරි කතාවේ පසුබිම තුලින් දැක්වෙන විශේෂ ලක්ෂණ සොයන්න.
- මෙම රංග සම්ප්‍රදාය හා සම්බන්ධ කවි ස්වර ප්‍රස්තාර සමග පුහුණු වන්න.
- එක් ගීතයක ස්වර ප්‍රස්ථාරය නැවත නැවත පුහුණු වීමෙන් පසු ගීතය ඒ අනුව ගයා පුහුණු වන්න.

**4.ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි ඉගෙනුම් ආධාරක**

- e - නැණ පියස:- 11 ශ්‍රේණිය පෙරදිග සංගීතය
- 11 ශ්‍රේණිය පෙරදිග සංගීතය අතිරේක කියවීම් පොත
  E තක්සලාව -www.e.thaksalawa.mov.gov.lk
  You yube – https://www.youtube.com/watch?v=rMrtMfU5c20
  https://www.youtube.com/watch?v=b1c3YMwiDl8
- ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර

**5.අපේක්ෂිත ඉගෙනුම් ඵල:-**

- ලංකාවේ පළමු ගැමිනාටකය වන සොකරි නාටකයේ සාම්ප්‍රදායික තොරතුරු විමසා බලයි.
- සොකරි රංග සම්ප්‍රදායේ විශේෂතා ,චරිත ඉදිරිපත් කරන ආකාරය හඳුනා ගනියි.
- සොකරි රංග ශෛලියේ විශේෂ ලක්ෂණ ලියයි.
- සොකරි ගීතයක් ගායනා කරයි.

## සොකරි නාටක ගීත

1. වෙදා නටන්නේ පළමු ව සබයට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
විදා පාන්නේ අත් දෙක තැගි කියන්නේ

2. සොකරි එන්නී සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී
පද අල්ලන්නී පියයුරු ළැම සොලවන්නී
කැඩපත ගන්නී සුරතින් මුහුණ බලන්නී

**I නාද මාලාව**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සසග | රිරි- | රි-රි | ගරිස | සසග | රිරි- | රි-- | ගරිස |
| සොකරි | sඑන් | නීsස | බයෙන් | අවස | රගන් | නීss | sss |
| සසග | රිස- | ස-ධ | ගරිග | රිසස | සස- | ස-- | --- |
| නැටුම් | නටන් | නීsතා | sලෙට | රාsග | කියන් | නීss | sss |

**II නාද මාලාව**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සසරි | ගග- | ග-රි | ගරිස | ස-රි | ගරි- | රි-- | ගරිස |
| සොකරි | sඑන් | නීsස | බයෙන් | අවස | රගන් | නීss | sss |
| සසරි | ගග- | ග-රි | ගරිස | ස-රි | ගරි- | ස-- | --- |
| නැටුම් | නටන් | නීsතා | sලෙට | රාsග | කියන් | නීss | sss |

ඉතිරි ගී පාද ද මේ තනුවට ම ගැයේ

3. පාට වරුණ පුත - පර මණ්ඩල පුත
නුඹ නාඩන් පුත - හරි රාරෝ
නින්ද තොටිල්ලේ - නැළවෙන් මගෙ පුත
නුඹ නාඩන් පුත - හරි රාරෝ

| | | | |
|---|---|---|---|
| + සරි ග ග | රි ස සරි ග | + රි ග රි ස | ස රි ස නි |
| + පාs ට ව | රු ණ පුs ත | + පර ම ණ් | ඩ ල පු ත |
| + නිස ස ස | ස - සරි ග | + රි ග රි ස | ස - - - |
| + නුඹ නා s | ඩ න් පුs ත | + හරි රා s | රෝ s s s |

**6.ඇගයීම හා තක්සේරු කරන ක්‍රමවේදය:-**

1. සොකරි රංග සම්ප්‍රදායේ විශේෂ ලක්ෂණ ලියන්න.
2. එහි ඇති චරිත හා කතාව ඉදිරිපත් කරණ ආකාරය ලියා දක්වන්න.
3. සොකරි ගී නාද මාලාවේ දක්නට ඇති ලක්ෂණ මොනවාද? කෙටියෙන් ලියන්න.
4. සොකරි ගීතයක් ගායනා කරන්න.

**සැකසුම:-** කෑගල්ල අධ්‍යාපන කලාපය